# ජනමාධ්‍ය අමාත්‍යාංශය

## භෞමික රූපවාහිනී විකාශන ව්‍යාපෘතිය ඩිජිටල්කරණය කිරීම

## බඳවා ගැනීම්

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු), සහකාර අධ්‍යක්ෂ (මුදල්) හා නීති නිලධාරී යන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ, විදේශ මූල්‍යායන ව්‍යාපෘතීන්හි කටයුතු කිරීමේහිලා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

රූපවාහිනී විකාශන ක්ෂේත්‍රයෙහි පවත්නා ගෝලීය ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි දේශීය ප්‍රතිසම රූපවාහිනී විකාශන ජාලය අංකිතකරණය කිරීම සඳහා වන ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කර ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) ස්ථාපිත කිරීමට අදහස් කරනු ලබන අතර එය මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වනු ඇත.

## නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු) -01

**වගකීම**

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු) විසින් තම තනතුරට අදාලව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදුකරන කටයුතු සඳහා සෘජුවම ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වගකිව යුතු වේ.

**සුදුසුකම්**

ඉලෙක්ට්‍රොනික හා ජන සන්නිවේදන ඉංජිනේරු විද්‍යා හෝ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ඕනෑම අදාල ක්ෂේත්‍රයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධිත සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් සාර්ථකව නිම කිරීම

**සහ**

අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 06ක පළපුරුද්ද ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 13ක පළපුරුද්ද

**හෝ**

අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් ආයතනයකින් ලබාගත් ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය (Corporate Membership) හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සමඟ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාල ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05ක පළපුරුද්ද ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 11ක පළපුරුද්ද

**හෝ**

පශ්චාත් උපාධි සුදුසුකම් හා අදාල ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය (Corporate Membership) හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් සමඟ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක වසර 04ක පළපුරුද්දක් ඇතුළුව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 09ක පළපුරුද්දක් සහිත විය යුතුය.

## සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මුදල්) -01

**වගකීම**

සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (මුදල්) විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදුකරන කටයුතු සඳහා සෘජුවම ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වාර්තා කරනු ඇත.

**සුදුසුකම්**

අදාළ ක්ෂේත්‍රයෙහි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයකින් ලබාගත් උපාධියට සමාන සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

**හෝ**

ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ III / II පංතියේ ඉන් ඉහළ නිලධාරියකු හෝ ඒ හා සමාන තත්ත්වයක නිලධාරියකු වීම

**සහ**

අදාළ ක්ෂේත්‍රයෙහි අධ්‍යාපන/සේවා සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසු වසර 08ක සේවා පලපුරුද්ද

## නීති නිලධාරී -01

**වගකීම**

නීති නිලධාරි විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් සිදුකරන කටයුතු සෘජුවම ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත වාර්තා කරනු ඇත.

**සුදුසුකම්**

ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයකු වීම

**සහ**

ශ්‍රේෂ්ඨාධිකරණයෙහි දිවුරුම් දීමෙන් අනතුරුව වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පලපුරුද්ද

## වෙනත් විස්තර

**පාරිශ්‍රමිකය / වේතනය**

අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ගෙවීම් කරනු ලැබේ.

**වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 55ට අඩු විය යුතුය.

**අනෙකුත් සුදුසුකම්**

සෑම අයදුම්කරුවකුම,

i. ශ්‍රී ලාංකේය පුරවැසියකු විය යුතුය.

ii. තනතුරෙහි රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා මනා කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

උක්ත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් විසින් සිය අයදුම්පත් ජීව දත්ත විස්තරය ද, සුදුසුකම් සහ පළපුරුද්ද සහතික/සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛන ද, මෑතකදී ගත් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් ද සමඟ ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය, 163, ඇසි දිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් (අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම් කෙළවරේ ඉහළ සඳහන් කළ යුතුය) හෝ **secretary@media.gov.lk** ඊමේල් ලිපිනයට 2021 ජූලි මස 15 වන දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි එවිය යුතුය.

ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය